# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2193/38 – 2020 සැප්තැම්බර් 18 වැනි සිකුරාදා – 2020.09.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2020 අංක 120 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2017/WS/202.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: J/DS/2/9/4/6-2016.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 12 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, යාපනය.

2. **ඉඩමේ විස්තරය.–** උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, J/66, ඊච්චමෝට්ටයි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, යාපනය මහනගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 6 (කොයියාතෝට්ටම්), චුන්ඩිකුළි ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ya/JFF/2017/196 හා 2018.01.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – වරි. අංක නොදන්නා පාල්කුලම්, පාල්කුලම් පටුමග – ප්‍රමාණය: හෙක්. 0.0034 ක් පමණ**

උතුරට: පාල්කුලම්, කොයියාතෝට්ටම් ප්‍රජා මධ්‍යස්ථානය සහ පාල්කුලම් පොකුණ; නැගෙනහිරට: පාල්කුලම් පොකුණ සහ පාල්කුලම්වායල්, වික්ටෝරියපුල්ලෙයි ඥානප්‍රකාසම්; දකුණට: පාල්කුලම්වායල්, වික්ටෝරියපුල්ලෙයි ඥානප්‍රකාසම් සහ කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B සහ පාල්කුලම්, කොයියාතෝට්ටම් ප්‍රජා මධ්‍යස්ථානය.

02. **කැබලි අක්ෂර 'B' – පාල්කුලම් – ප්‍රමාණය: හෙක්. 0.0193 ක් පමණ**

උතුරට: පාල්කුලම් පටුමග, පාල්කුලම් කොයියාතෝට්ටම් ප්‍රජා මධ්‍යස්ථානය සහ කැබලි අක්ෂර A; නැගෙනහිරට: කැබලි අක්ෂර A සහ පාල්කුලම්වායල්, වික්ටෝරියපුල්ලෙයි ඥානප්‍රකාසම්; දකුණට: පාල්කුලම්වායල්, වික්ටෝරියපුල්ලෙයි ඥානප්‍රකාසම් සහ අන්තෝනිදාස් ජීවරත්නම්; බටහිරට: පාල්කුලම්වායල්, අන්තෝනිදාස් ජීවරත්නම් සහ පාල්කුලම් පටුමග.

10 – 107



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2020 අංක 119 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/12/2018/WS/290.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/KGK/4/2(2)/2018/02/04.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 12 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළය.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැවතැන්න (274) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අළුපතකඩහේන, මුල්ලේපිහිල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/MHN/2018/619 හා 2019.10.18 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – අළුපතකඩ හේන සහ ඔරුවේහේන – ප්‍රමාණය: හෙක්. 0.0506 ක් පමණ**
උතුරට සහ නැගෙනහිරට: කල්‍යාණ ප්‍රබෝධ දිසානායක හිමිකම් කියන අළුපතකඩ හේන සහ ඔරුවේහේන; දකුණට: කල්‍යාණ ප්‍රබෝධ දිසානායක හිමිකම් කියන අළුපතකඩ හේන සහ ඔරුවේහේන සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ කල්‍යාණ ප්‍රබෝධ දිසානායක හිමිකම් කියන අළුපතකඩ හේන සහ ඔරුවේහේන.

10 – 108

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

**2020 අංක 118 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2017/WS/589.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/HAR/4/2/1/51.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම්, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ අනුරූප සටහනේ විස්තරව ඇති පරවශ්‍යතාවයට යටත් වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 12 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ, රුවන්පුර (460) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රුවන්පුර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/HRS/2018/401 හා 2019.02.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

2. **පරවශ්‍යතාවේ විස්තරය.–** මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ යහලතැන්න සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම් කොටසක පරවශ්‍යතා අයිතිය අත්කර ගැනීම.

01. **කැබලි අක්ෂර 'A' – ප්‍රමාණය: හෙක්. 0.0038 ක් පමණ**
උතුරට: සී. ජයදේවි සහ ඒ. කල්‍යාණි හිමිකම් කියන දෙල්ගස්මුදුන සහ කැබලි අක්ෂර B; නැගෙනහිරට: කැබලි අක්ෂර B සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ ටී. ඒ. සී. පී. තේනුවර හිමිකම් කියන රුවන්පුර ජනපදය; බටහිරට: ටී. ඒ. සී. එච්. තේනුවර හිමිකම් කියන රුවන්පුර ජනපදය.

02. **කැබලි අක්ෂර 'B' – ප්‍රමාණය: හෙක්. 0.0071 ක් පමණ**
උතුරට: සී. ජයදේවි සහ ඒ. කල්‍යාණි හිමිකම් කියන දෙල්ගස්මුදුන සහ කැබලි අක්ෂර C; නැගෙනහිරට: කැබලි අක්ෂර C සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ කැබලි අක්ෂර A; බටහිරට: කැබලි අක්ෂර A.

03. **කැබලි අක්ෂර 'C' – ප්‍රමාණය: හෙක්. 0.0038 ක් පමණ**
උතුරට: සී. ජයදේවි සහ ඒ. කල්‍යාණි හිමිකම් කියන දෙල්ගස්මුදුන සහ යූ. ජී. එස්. උඩගම හිමිකම් කියන රුවන්පුර ජනපදය; නැගෙනහිරට: යූ. ජී. එස්. උඩගම හිමිකම් කියන රුවන්පුර ජනපදය සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B.

10 – 109

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.